**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**
**முதியோர்களுக்கான தேசிய செயலகம்**

# වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන - 2026

## • හැඳින්වීම

වයස අවුරුදු 60 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341 තුළ , අමාත්‍යාංශය යටතේ වන උපදේශන අංශය හා ඒකාබද්ධව මෙම වැඩසටහන ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව වැඩිහිටි තැනැත්තන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා **වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදලේ** මූල්‍ය දායකත්වයෙන්, 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වන වගන්තිය ප්‍රකාරවද, ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියේ 6.2 වගන්තිව අනුව සහ **"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්"** රජයේ ජාතික ප්‍රතිපත්ති රටාව යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම සත්කාරය තුළින් අපේක්ෂිත අරමුණු වනුයේ ,

- වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම.
- වැඩිහිටියන්ගේ මානසික ගැටළු අවම කිරීම.
- වැඩිහිටියන්ගේ මානසික සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
- ක්‍රියාශීලී වැඩිහිටි ප්‍රජාවක් බිහිවීම හරහා රටේ ආර්ථිකයෙහි කොටස්කරුවන් බවට පත්කර ගැනීම.
- වැඩිහිටියන්ගේ හුදෙකලාභාවය අවම කිරීම.

මෙම වැඩසටහන ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩිහිටියන්ගේ අවශ්‍යතා හඳුනාගෙන සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර උපදේශන නිලධාරීන් හා ඊට අදාළ පාර්ශවයන් සම්බන්ධ කරගනිමින් සිදු කළ යුතුය.

## • ක්‍රියාත්මක ක්‍රමවේදය

දිවයින පුරා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම, පහසුවෙන් වැඩිහිටියන් රැස්විය හැකි ස්ථානයක් තෝරා ගනිමින් පහත කරුණු ද සැලකිල්ලට ගෙන වැඩසටහන සිදු කළ යුතුය. මෙම වැඩසටහන සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු.30,000/- ක මුදලක් ලබා දෙනු ලැබේ.

1. වයස අවුරුදු 60 ඉක්ම වූ පුද්ගලයන් සම්බන්ධ කර ගැනීම.
2. වැඩිහිටියන්ගේ ගැටලු හඳුනාගනිමින් වැඩසටහන සැලසුම් කිරීම.
3. අදළ වැඩසටහන සඳහා පුහුණුවලත් මනෝවිද්‍යා උපදේශකයින් හා සුදුසු අදාළ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීම.
4. අදාළ මුදල් සීමාව තුළ වැඩසටහන කළමනාකරණය කර ගත යුතු අතර, අවශ්‍යනම් අනුග්‍රාහක භවතුන්ගේ දායකත්වය ලබා ගත හැකිය.
5. මනෝවිද්‍යා උපදේශන ආචාරධර්ම අනුගමනය කරමින් කටයුතු කළ යුතුය.
6. මෙම වැඩසටහන ඔක්තෝබර් 10 දින යෙදෙන ලෝක මානසික සෞඛ්‍ය දිනයට සමගාමීව සිදුකළ යුතුය.

2. ඇමුණුම - 01 පරිදි සකස් කරන ලද ඉල්ලුම් පත්‍රය හා වියදම් ඇස්තමේන්තුව 2026.07.15 දිනට පෙර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

- මෙම වැඩසටහන සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන ඔබ වෙත ලැබු වහාම පොදු 172 රිසිට්පත ලැබීමට සැලැස්විය යුතුය.

- මෙම වැඩසටහන අවසන් වි වැඩ අවසන් වාර්තාව කඩිනමින් ලැබීමට සැලැස්විය යුතු අතර, එහිදී වැඩසටහනට සහභාගී වු වැඩිහිටියන්ගේ අත්සන් ලේඛනය සහ වැඩසටහනට සහභාගී වූ නිලධාරි මඩුල්ලගේ අත්සන් ලේඛනය ,වැඩසටහනට අදාළ ඡයාරුප ද එහි අඩංගු විය යුතුය.

- මෙම වැඩසටහනේ ඉතිරි මුදල් **වැඩිහිටි තැනැත්තන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදල** -228075 (National Fund for The Welfare of Elders) ගිණුමට බැර කළ යුතුය.

ඉහත කර්තව්‍ය සාර්ථකව ඉෂ්ට කිරීම තුළින් වැඩිහිටියන්ගේ සැඳෑ සමයේ කායික හා මානසික නිරෝගී සුවයෙන් හා ආත්ම ගරුත්වයක් ,ස්වාධීනත්වයක් ඇතිව ජිවත් වීමේ පරිසරයක් නිර්මාණය කිරීමට අපහට හැකිවනු ඇත.